# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1987/23 - 2016 ඔක්තෝබර් මස 05 වැනි බදාදා - 2016.10.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනත**

4 වන වගන්තිය යටතේ නියමය

1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, විදේශ අමාත්‍ය මංගල සමරවීර වන මම, ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ පිළිබඳ ආයතනය ලෙස පෙර හඳුන්වනු ලැබූ දැනට ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය ලෙස හඳුන්වන එම ආයතනයේ ආධාර කණ්ඩායම වෙනුවෙන් ක්‍රියා කරන ෆෝඩ් පදනම සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 1983 සැප්තැම්බර් මස 01 වැනි දින ඇතිකර ගනු ලැබූ ගිවිසුම් ප්‍රකාශයෙහි, මෙහි උපලේඛනයෙහි සඳහන් වන එම ගිවිසුමෙහි අදාළ වගන්තිවල නියමයන් බලාත්මක කිරීමට අවශ්‍ය වන ප්‍රමාණයට ඉහත කී පනතේ විධිවිධාන ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතනයට අදාළ විය යුතු යයි මෙහි නියමය මගින් ප්‍රකාශයට පත් කරමි.

මංගල සමරවීර පා.ම.,
විදේශ කටයුතු අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

**වාරිමාර්ග කළමනාකරණය පිළිබඳව පර්යේෂණ හා පුහුණු කිරීම් සඳහා ජාත්‍යන්තර ආයතනයක් පිහිටුවීම පිණිස වාරිමාර්ග කළමනාකරණ ආයතනයේ (දැනට ජාත්‍යන්තර ජල කළමණාකරන ආයතනය ලෙස හඳුන්වන) ආධාර කණ්ඩායම් වෙනුවෙන් ක්‍රියා කරන ෆෝඩ් පදනම සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර ඇති කරගනු ලැබූ ගිවිසුම් ප්‍රකාශය**

7. එකඟවීම - (අ) ජාත්‍යන්තර වාරිමාර්ග කළමණාකරණ ආයතනය, මෙම ප්‍රකාශයෙහි අරමුණු හා කාර්යයන්හි නියැලී සිටින ස්වායත්ත, ජාත්‍යන්තර, ලාභ නොලබන, පර්යේෂණ, අධ්‍යයන හා පුහුණුකිරීමේ ආයතනයක් බව ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් පිළිගත යුතු ය. ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතනයේ ජාත්‍යන්තර තත්ත්වය සහ පෞද්ගලිකත්වය එහි ප්‍රඥප්තිය මගින් සහතික කරනු ලබන අතර ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් එය පිළිගනු ලැබේ.

ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතනයට සමහර පහසුකම් ලබා දීමට ද පහත සඳහන් ඒවා ද ඇතුළුව එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහනේ ශ්‍රී ලංකා කාර්යාලයට පිරිනමා ඇති සමාන වරප්‍රසාද හා මුක්තිවලට වඩා අවාසිදායක නොවූ යම් වරප්‍රසාද හා මුක්තීන් ප්‍රධානය කිරීමට ද ශ්‍රී ලංකා ආණ්ඩුව එකඟ වේ.

*ඇමුණුම*

*මුක්ති හා වරප්‍රසාද*

*1 වැනි කොටස*

**ආයතනයේ මුක්ති හා වරප්‍රසාද**

1. ආයතනය හා එහි දේපළ වත්කම් කොතැනක තිබුණ ද කවරෙකු විසින් අත්කර ගෙන තිබුණ ද යම් විශේෂ කරුණක දී ප්‍රකාශිතව එහි මුක්තීන් අත්හැර ඇති අවස්ථාවක දී ඒ තාක් දුරට හැර, සියලු ආකාරයේ නෛතික ක්‍රියාවලීන්ගෙන් මුක්තිය ලැබිය යුතු ය. කෙසේ වෙතත්, අත්හැරීමක් යම් ප්‍රමාණයක ඇක්කිසි කිරීමත් දක්වා ව්‍යාප්ත නොවන බව තේරුම් ගෙන ඇත.

2. ආයතනයේ පරිශ්‍රය අලංඝනීය විය යුතු ය. ආයතනයේ දේපළ හා වත්කම් කොතැනක පිහිටා තිබුණ ද, කවුරුන් විසින් දරමින් සිටිය ද, සෝදිසි කිරීමෙන්, අධිග්‍රහණයෙන්, රාජසතු කිරීමෙන්, අපසර්ජනයෙන් සහ විධායක, පරිපාලන, අධිකරණ හෝ ව්‍යවස්ථාදායක ආදී වෙනත් ආකාරයේ අතුරු බාධකයන්ගෙන් මුක්ත විය යුතු ය.

3. කොතැනක තිබුණ ද, ආයතනයේ පැරණි ලේඛණාගාරය සහ පොදුවේ එයට අයත් හෝ එමගින් අත්කර ගෙන ඇති සියලුම ලේඛන අලංඝනීය විය යුතු ය.

4. යම් ආකාරයක මූල්‍යමය පාලනයකින් විධිමත් කිරීමකින් හෝ විලම්භිත කාලයක් මගින් සීමා කිරීමෙන් තොරව -

(අ) ආයතනය විසින් අරමුදල් හෝ ඕනෑම වර්ගයක මුදල් අත්කර ගැනීම සහ ඕනෑම මුදලකින් ගිණුම් පවත්වාගෙන යාම කළ හැකි ය.

(ආ) ආයතනයේ අරමුදල් හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වෙනත් යම් රටකට මාරු කිරීමට ප්‍රතිලෝම වශයෙන් එසේ කිරීමට හෝ ශ්‍රී ලංකාව තුළ එසේ කිරීමට සහ එමගින් දරනු ලබන යම් මුදලක් වෙනත් යම් මුදලකට හැරවීමට එයට නිදහස තිබිය යුතු ය.

එතෙකුදු වුවත් ශ්‍රී ලංකාවේ දී අත්පත් කර ගනු ලැබූ අරමුදල් හෝ මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින් වූ අරමුදල් හෝ මුදල්, මාරුකිරීමේ දී හෝ හැරවීමේ දී නීතියෙන් නියම කර ඇති යම් සීමා කිරීම්වලට යටත් විය හැකිය.

5. ආයතනය. එහි වත්කම්, ආදායම් සහ අනෙකුත් දේපළ -

(අ) සියලුම සෘජු අය බදුවලින් නිදහස් කළ යුතු ය. කෙසේ වෙතත්, පොදු උපයෝගීතා සේවාවන් සඳහා අයකරනු ලබන වරිපනම් හා බදුවලින් නිදහස් කරන ලෙස ආයතනය විසින් ඉල්ලා සිටින බවක් ඉන් අදහස් නොකෙරේ.

(ආ) ආයතනය, එහි නිල කාර්යයන් සඳහා ආනයනය හෝ අපනයනය කරනු ලබන භාණ්ඩ වෙනුවෙන් තීරුබදු හා බදු අය කිරීමෙන් නිදහස් කළ යුතු ය. කෙසේ වෙතත් එවැනි නිදහස් කිරීම් යටතේ ආනයනය කරනු ලැබූ භාණ්ඩ ප්‍රතිඅපනයනය කළ යුතු අතර, ශ්‍රී ලංකා ආණ්ඩුවේ පූර්ව අවසරයක් නොමැතිව ඒවා ශ්‍රී ලංකාව තුළ විකිණීම නොකළ යුතු ය. ශ්‍රී ලංකාව තුළ විකුණනු ලැබුවේ නම් එවැනි භාණ්ඩ සාමාන්‍ය තීරු ගාස්තු හා බදුවලට යටත් වන්නේ ය.

(ඇ) එහි ප්‍රකාශන ආනයනයන් හා අපනයනයන් තීරුබදු හා බදුවලින් ද තහනම් කිරීම් හා සීමාකිරීම්වලින් ද නිදහස් විය යුතු ය.

6. ප්‍රමුඛත්වය පිළිබඳ කරුණු, තැපැල, කේබල් පණිවුඩ,විදුලි පිණිවුඩ ගුවන්විදුලිය හා රූපවාහිනිය මගින් තොරතුරු ලබාදීම සඳහා ප්‍රචාරක ගාස්තු සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් එක්සත් ජාතීන්ට ප්‍රදානය කර ඇති ප්‍රමාණයට වඩා අවාසිදායක නොවන සැළකිල්ලක් ආයතනයේ නිල සංදේශන කටයුතුවල දී එයට භුක්ති විඳීමට ඉඩ දිය යුතු ය. ආයතනයේ නිල ලිපි හුවමාරු හා අනෙකුත් නිල පණිවුඩ හුවමාරු වෙනුවෙන් ප්‍රවෘත්ති පාලනයක් නොකළ යුතු ය.

7. සංකේත භාවිතයත් පණිවුඩකරුවන් හෝ මලු මගින් එහි ලිපි හුවමාරු කර ගැනීමටත් ආයතනයට අයිතිය තිබිය යුතු අතර, ඒවා ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් කාර්යාලයට ලබා දී ඇති මුක්ති හා වරප්‍රසාද වලට සමාන විය යුතු ය.

8. ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් කාර්යාලය සහ එහි දේපළ, අරමුදල් හා වත්කම් ආදියට ලබා දී ඇති සමාන වූ වෙනත් එවැනි වරප්‍රසාද මුක්තීන් ද තිබිය යුතු ය.

*11 වැනි කොටස*

**ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මුක්තීන් හා වරප්‍රසාද**

ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මුක්තීන් හා වරප්‍රසාද තානාපති දූතමණ්ඩල ප්‍රධානියකුට ලබාදී ඇති තත්ත්වයට හා වරප්‍රසාදවලට සමාන වූ ද එක්සත් ජාතීන්ගේ නේවාසික නියෝජිතයාට ලබා දී ඇති සමාන මුක්තීන් හා වරප්‍රසාද අධ්‍යක්ෂ ජනරාල්වරයාට තිබිය යුතු ය.

*111 වැනි කොටස*

**ආයතන නිලධාරීන්ගේ මුක්තීන් හා වරප්‍රසාද**

ආයතන නිලධාරීන්ගේ මුක්තීන් හා වරප්‍රසාද ආයතනයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට මෙම කොටස අදාළ වේ. ආයතනය වෙනුවෙන් දූත මෙහෙවර යෙදෙන විශේෂඥයන්ට ඔවුන්ගේ කාර්යයන් ස්වාධීනව ඉටුකිරීමට අවශ්‍යවන වරප්‍රසාද හා මුක්තීන් ඔවුන් දූත මෙහෙවර යෙදෙන කාලසීමාව තුළ දී මෙම කොටස යටතේ ලබා දිය යුතුය.

3 සිට 5 දක්වා වූ වගන්ති පුරවැසියනට හා ශ්‍රී ලංකාවේ නිත්‍ය නේවාසිකයන්ට අදාළ නොවේ.

1. ඔවුන්ගේ නිල ශක්නුතාවය තුළ ඔවුන් විසින් ප්‍රකාශ කරනු ලැබූ හෝ ලියනු ලැබූ වචන සහ කරනු ලැබූ ක්‍රියාවන් සම්බන්ධයෙන් සෑම ආකාරයේම නෛතික ක්‍රියාවලියෙන් මුක්තවීම.

2. ආයතනයෙන් ඔවුනට ගෙවනු ලබන වැටුප් හා පඩිනඩි අයබදු වලින් නිදහස් කිරීම.

3. ඔවුන්ද, ඔවුන්ගේ කලත්‍රයන් හා යැපෙන ඥාතීන් ද ආගමික සීමාකිරීම්, පරදේශීන් ලියාපදිංචි කිරීම් සහ ජාතික සේවා බන්ධනයන්ගෙන් නිදහස් කිරීම.

4. ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් කාර්යාලයේ නිලධර කොටස්වල සමාන පදවි දරන්නන් වෙත ලබා දී ඇති විනිමය පහසුකම් සඳහා වූ සමාන වරප්‍රසාදයන් ලබා දීම.

5. ජාත්‍යන්තර අර්බුදයක් පවත්නා අවස්ථාවකදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් කාර්යාලයේ කාර්යය මණ්ඩලයට දෙනු ලබන සමාන නිත්‍ය රටවැසිභාවය අත්හැරීමේ අයිතිය ඔවුන්ගේ කලත්‍රයන් හා යැපෙන ඥාතීන් ඇතුලුව ඔවුන්ට ලබා දීම.

6. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් ශ්‍රී ලංකා කාර්යාලයේ සමාන පදවි දරන නිලධරයන්ට ලබා දෙන වෙනත් එවැනි වරප්‍රසාද හා මුක්තීන්.

මෙම කොටස අදාළ විය යුතු තැනැත්තන්ගේ නම් අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් කලින් කලට ශ්‍රී ලංකා ආණ්ඩුවට දැන්විය යුතුය.

*IV වැනි කොටස*

**වරප්‍රසාද හා මුක්තීන් අත්හැරීම**

අධ්‍යක්ෂ ජනරාල්වරයාටද ආයතනයේ නිලධරයන්ට සහ ආයතනය වෙනුවෙන් දූත මෙහෙවරෙහි යෙදෙන විශේෂඥයන්ට වරප්‍රසාද හා මුක්තීන් ලබාදිය යුත්තේ ඔවුන්ගේ පෞද්ගලික වාසිය සඳහා නොව ආයතනයේ යහපත උදෙසා ය. ඒ අනුව කෙසේ වෙතත් යුක්තිය පසඳලීමේ ක්‍රියාමාර්ග අවහිර වන විට ආයතනයේ පාලකයා විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පිළිවෙලින් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ හෝ යම් නිලධරයෙකුගේ හෝ විශේෂඥයෙකුගේ මුක්තීන් අත්හැරීමට අයිතිය හා යුතුකම තිබෙන අතර, ආයතනයේ යහපතට අගතියක් නොවන පරිදි අත්හැරීම කළ හැකි ය.

*V වැනි කොටස*

**රේගු ආනයන බදු සහ අයබදු පිළිබඳ වරප්‍රසාද හා මුක්තීන්**

නිත්‍ය රටවැසි භාවය අත්හල ආයතනයේ නිලධරයන්ටද ජාත්‍යන්තර මට්ටමෙන් බඳවාගනු ලැබ, ඔවුන්ගේ කාර්ය සහ කර්තව්‍ය සඳහා නියමයක් හෝ ඊට වැඩි කාලයක් ශ්‍රී ලංකාවේ නේවාසිකව සිටි ශ්‍රී ලංකාවේ රටවැසියන්ට හා නිත්‍ය නේවාසිකයන්ට පමණක් මෙම කොටස අදාළ වේ.

රේගු සහ ආනයන බදු සහ අයබදු පිළිබඳ වරප්‍රසාද හා මුක්ති ජාත්‍යන්තර මට්ටමෙන් බඳවා ගනු ලැබූ ඔවුන්ගේ කාර්ය හා කර්තව්‍යයන් සඳහා හය මසක් හෝ ඊට වැඩි කාලයක් ශ්‍රී ලංකාවේ නේවාසිකව සිටි නිත්‍ය රටවැසි භාවය අත්හල ආයතනයේ නිලධරයන්ට හා ශ්‍රී ලංකාවේ නිත්‍ය නේවාසික වූ රටවැසියන්ට පමණක් මෙම කොටස අදාළ වේ.

මෙම කොටස අදාළ වන තැනැත්තන්ට තීරුබදු හා අයබදු වලින් නිදහස්ව හා ඇප තැබීමකින් තොරව :-

1. ශ්‍රී ලංකාවේ ප්‍රථමයෙන් ඔවුන්ගේ ධූරය භාරගත් දිනයේ සිට මුල් හය මාසය ඇතුළත එක් මෝටර් රථයක් ද එක්සත් ජාතීන්ගේ වැඩසටහනේ ශ්‍රී ලංකා කාර්යාලයේ සමාන පදවි දරන තැනැත්තන්ට ලබා දී ඇති පරිදි ඔවුන්ගේ හා ඔවුන් සමග පැමිණෙන පවුල්වල පෞද්ගලික ප්‍රයෝජනය සඳහා සීමිත ගෘහභාණ්ඩ හා උපකරණ ප්‍රමාණයක් -

   (අ) එක් එක් ගෘහයන් සඳහා එක්මෝටර් රථයක් එක් ශීතකරණයක් එක් අධි ශීතකරණයක්, එක් උඳුනක් එක් රෙදි සෝදන යන්ත්‍රයක්, එක් පිඟන් සේදීමේ යන්ත්‍රයක්, එක් ගුවන් විදුලි යන්ත්‍රයක්, එක් තැටි ධාවන යන්ත්‍රයක්, (රෙකෝඩ් ප්ලේයර්) එක් පටි ධාවන යන්ත්‍රයක් (ටේප් රෙකෝඩර්) එක් වීඩියෝ රෙකෝඩරයක් බැගින් සහ සුළු විදුලි උපකරණයක් ද,

   (ආ) එක් එක් තැනැත්තා සහ එක් වායු සමීකරණය බැගින් ඡායාරූප ගැනීමේ උපකරණ කට්ටලයක් සහ එක් ගුවන් විදුලි සහ කැසට් රෙකෝඩර් යන්ත්‍රයක් ද,

2. විවාහකයෙකුව පවුලක් සමග පැමිණියේ නම් පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු. 6,000ක වටිනාකම දක්වා වූ ආහාර ද්‍රව්‍ය, මත්පැන්, සිගරට් සහ වෙනත් දෛනික ප්‍රයෝජනයට ගන්නා පාරිභෝගික ද්‍රව්‍ය තුන් මාසයකට වරක් නැව තෙක් නොමිළයේද අවිවාහක හෝ විවාහකයන්ව පවුලත් සමග නොපැමිණියේ නම් තුන් මාසයකට වරක් රු. 3,900ක් වටිනා භාණ්ඩ නැව තෙක් නොමිළයේ ද, ආනයනය කළ හැකි ය.

3. පෞද්ගලික හෝ පවුලේ ප්‍රයෝජනය සඳහා සීමිත ප්‍රමාණ වල ගෘහ භාණ්ඩ ප්‍රතියෝජනය හා අතිරේක ආනයනයන් සඳහා වූ ඉල්ලීම පිළිබඳ අදාළ හා ශ්‍රී ලංකා බලාධිකාරයක් විසින් සුදුසු අවස්ථාවල හා එක් එක් කරුණු අනුව සළකා බැලීමේ පදනම මත නිසි සැළකිල්ල යොදවනු ඇත.

10-712/1

---

**1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනත**

4 වන වගන්තිය යටතේ නියමය

1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව විදේශ අමාත්‍ය මංගල සමරවීර වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සමග 1990 මාර්තු මස 20 වන දින ඇති කර ගන්නා ලද ගිවිසුමෙහි, මෙහි උපලේඛනයෙහි සඳහන් වන එම ගිවිසුමෙහි අදාළ වගන්තිවල නියමයන් බලාත්මක කිරීමට අවශ්‍ය වන ප්‍රමාණයට, ඉහත කී පනතේ විධිවිධානයන් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනට අදාළ වියයුතු යැයි මෙම නියමය මගින් ප්‍රකාශයට පත් කරමි.

මංගල සමරවීර පා.ම.,
විදේශ කටයුතු අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 30 වැනි දින.
කොළඹ දී ය.

## උපලේඛනය

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන අතර ඇති කර ගන්නා ලද ගිවිසුම

### *IX වැනි වගන්තිය*

*වරප්‍රසාද හා මුක්ති*

1. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අනුයෝජිතයන් ලෙස ක්‍රියා කරන එක්සත් ජාතීන්ගේ උපකාරක ආයතනයන් ඔවුන්ගේ දේපළ, අරමුදල් හා වත්කම් ඇතුළු එක්සත් ජාතීන් හා එහි ආයතන කෙරෙහිද නේවාසික නියෝජිතයා සහ මෙරට ඇති එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ දූත මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයන් ඇතුළු ඔවුන්ගේ නිලධරයන් කෙරෙහිද ආණ්ඩුව විසින් වරප්‍රසාද හා මුක්ති පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි විධිවිධාන අදාළ කළ යුතු ය.

2. ක්‍රියාත්මක කිරීමෙහි අනුයෝජිතයෙකු ලෙස ක්‍රියා කරනු ලබන එක් එක් විශේෂිත අනුයෝජිතයා, එහි දේපළ, අරමුදල් හා වත්කම් කෙරෙහිද,එහි නිලධරයන් කෙරෙහි ද විශේෂිත සම්මුතියෙහි, එම විශේෂිත අනුයෝජිතයන්ට අදාළ වන්නා වූ සම්මුතියෙහි යම් ඇමුණුම්ද ඇතුළත් විධිවිධාන ආණ්ඩුව විසින් අදාළ කළ යුතුය. ජාත්‍යන්තර පරමාණු බලශක්ති අනුයෝජ්‍යායතනය ක්‍රියාත්මක කිරීමේ අනුයෝජිතයා වන විට එහි දේපළ, අරමුදල් හා වත්කම් කෙරෙහිද එහි නිලධරයන් විශේෂඥයන් කෙරෙහිද ආණ්ඩුව විසින් ජාත්‍යන්තර පරමාණු බලශක්ති අනුයෝජ්‍යායතනය පිළිබද ගිවිසුමේ වරප්‍රසාද හා මුක්ති අදාළ කළ යුතු ය.

3. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ දූත මණ්ඩලයේ කාර්යයන් ක්‍රියාත්මක ලෙස ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය වෙතැයි අන්‍යොන්‍ය ලෙස ගිවිස ගනු ලබන අතිරේක වරප්‍රසාද හා මුක්ති මේ රටෙහි ඇති එම දූත මණ්ඩලයේ සාමාජිකයන්ට ලබා දිය යුතු ය.

4. (අ) විශේෂිත ව්‍යාපෘති වලට අදාළ ව්‍යාපෘති ලේඛන මගින් පාර්ශවයන් අතර අන්‍යාකාරයකින් ගිවිසගෙන ඇති විටදී හැර ඉහත 1. හා 2 වන ඡේදයන්ගෙන් ආවරණය නොවූ දේශීය වශයෙන් සේවයේ නියුක්ත ශ්‍රී ලාංකික පුරවැසියන්ට හැර, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන,විශේෂිත අනුයෝජ්‍යායතනයන් හෝ ජාත්‍යන්තර පරමාණු බලශක්ති අනුයෝජ්‍යායතනය වෙනුවෙන් සේවාවන් සපයන්නා වූ අනෙකුත් සියළුම තැනැත්තන් එක්සත් ජාතීන්ගේ නිලධරයන් ලෙස සළකා වරප්‍රසාද හා මුක්ති පිළිබඳව එක්සත් ජාතීන්ගේ හෝ විශේෂිත අනුයෝජ්‍යායතන සම්මුතිවල හෝ ජාත්‍යන්තර පරමාණු බලශක්ති අනුයෝජ්‍යායතනයේ වරප්‍රසාද හා මුක්ති ගිවිසුමෙහි පිළිවෙළින් 18. 19 හෝ 18 වන වගන්තිය යටතේ දැක්වෙන එම වරප්‍රසාද හා මුක්තීන් ආණ්ඩුව විසින් ලබා දිය යුතුය.

(අ) මෙම වගන්තියෙහි පූර්වගාමී කොටසෙහි සඳහන් කරනු ලැබූ වරප්‍රසාද හා මුක්ති පිළිබඳව ලේඛනවල කාර්යන් සඳහා-

(1) ඉහත 4 (අ) උපඡේදයෙහි සඳහන් කරනු ලැබූ තැනැත්තන්ගේ සන්තකයේ හෝ පාලනය යටතේ ඇති ව්‍යාපෘතියකට අදාළ සියළු ලිපිලේඛන අවස්ථාවෝචිත පරිදි එක්සත් ජාතීන්ට අදාළ විශේෂිත අනුයෝජ්‍යායතනයට හෝ ජාත්‍යන්තර පරමාණු බලශක්ති අනුයෝජ්‍යායතනයට අයිති ලේඛනයන් ලෙස ද ;

(2) ව්‍යාපෘතියක කාර්යන් සඳහා මේ රටෙහි සිටින තැනැත්තන් විසින් මෙහි ගෙන්වනු ලැබූ හෝ මිළයට ගනු ලැබූ හෝ බද්දට ගනු ලැබූ උපකරණ ද, ද්‍රව්‍ය හෝ ;

සැපයීම් අවස්ථාවෝචිත පරිදි, එක්සත් ජාතීන්ගේ, විශේෂිත අනුයෝජ්‍යායතනයේ හෝ ජාත්‍යන්තර පරමාණු බලශක්ති අනුයෝජ්‍යායතනයේ දේපළ ලෙස සැළකිය යුතු ය.

5. මෙම ගිවිසුමෙහි IXX සහ XIII වන වගන්තිවල යොදා ඇති අකාරයට " සේවා සපයන තැනැත්තන් "යන්නෙහි ස්වේච්ඡා සේවකයන්, උපදේශකයන්, නෛතික මෙන්ම ස්වාභාවික තැනැත්තන් ද ඔවුන්ගේ සේවකයන් ද ඇතුළත් වේ. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් ක්‍රියාත්මක කිරීම සඳහා හෝ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් ආධාර ලබන ව්‍යාපෘතියකට සහ ඔවුන්ගේ සේවා නියුක්තයන්ට ක්‍රියාත්මක කිරීමේ දී ආධාර දීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් ක්‍රියාත්මක කිරීමේ අනුයෝජ්‍යායතනය ලෙස හෝ අන්‍යාකාරයකින් රඳවා ගනු ලැබූ රාජ්‍ය හෝ රාජ්‍ය නොවන සංවිධාන හෝ ව්‍යාපාරික ආයතනද මෙහි ඇතුළත් වේ. වෙනත් යම් ලේඛනයකින් එවැනි සංවිධාන හෝ ව්‍යාපාර ආයතන හෝ ඔවුන්ගේ සේවා නියුක්තයන් වෙත පවරා දෙනු ලැබූ වරප්‍රසාද, මුක්ති හෝ පහසුකම් මෙම ගිවිසුමෙහි සඳහන් කිසිවක් මගින් සීමාවන බවට තේරුම් නොගත යුතු ය.

**1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනත**

4 වන වගන්තිය යටතේ නියමය

1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනත 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, විදේශ අමාත්‍ය මංගල සමරවීර වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සමග 1987 ඔක්තෝබර් මස 01 වන දින ඇතිකර ගන්නා ලද ගිවිසුමෙහි ,මෙහි උපලේඛනයෙහි සඳහන් වන එකී ගිවිසුමෙහි අදාළ වගන්තිවල, නියමයන් බලාත්මක කිරීමට අවශ්‍ය වන ප්‍රමාණයට, ඉහත කී පනතේ විධිවිධාන සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස්වරයාට අදාළ විය යුතු යැයි මෙම නියමය මඟින් ප්‍රකාශයට පත් කරමි.

මංගල සමරවීර පා.ම.,
විදේශ කටයුතු අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 30 වැනි දින.
කොළඹ දී ය.

**උපලේඛනය**

**සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයා හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 1987 ඔක්තොම්බර් මස 01 වැනි දින දී හුවමාරු කරගත් ලිපිවල 4,5 සහ 6 ඡේද**

4. ඉහත 3 වැනි ඡේදයේ සඳහන් කරනු ලැබූ දූත මණ්ඩල කාර්යයන් කරගෙන යෑම සඳහා ඉහත කී සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමිසම සහ එහි නිළධරයන්ට ශ්‍රී ලංකාවේ සිටින එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහනේ නේවාසික නියෝජිතයාට හා ශ්‍රී ලංකාවේ පිහිටි එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් කාර්යාලයේ නිලධරයන්ට ලබා දී ඇති පළමුව පැමිණීමට වරප්‍රසාදය ද ඇතුළුව අධිකරණ මුක්තීන්, බදුවලින් නිදහස් කිරීම්, විනිමය පහසුකම්, රේගු පහසුකම් ආදියට සමාන වන ආකාරයෙන් ශ්‍රී ලංකාවේදී භුක්ති විඳීමට ලැබෙනු ඇත.

5. මෙම වරප්‍රසාදය හා මුක්ති ප්‍රදානය කර ඇත්තේ සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමිසමේ යහපත සඳහා මිස පුද්ගලයින්ගේ වාසිය සඳහා නොවන බව පිළිගෙන ඇත. එබැවින් එවැනි මුක්තියක් නිසා අධිකරණ ක්‍රියාමාර්ගයට අවහිර වන්නේ යැයි සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමිසම අදහස් කරන අවස්ථාවන්හි, සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමිසමේ යහපතට අගතියක් නොවන පරිදි, එමගින් යම් තැනැත්තෙකුගේ මුක්තීන් අත්හැරීම කළ යුතුය.

6. මෙම ලිපියේ ප්‍රකාර ප්‍රධානය කරනු ලැබූ වරප්‍රසාද, මුක්තීන් සහ පහසුකම්, මෙම ලිපියේ දිනයේ සිට එක් වර්ෂයක කාලයක් සඳහා වලංගු වන්නේ ය.

10-712/3

---

**1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනත**

4 වන වගන්තිය යටතේ නියමය

1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනත 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර විදේශ අමාත්‍ය මංගල සමරවීර වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සමග 1996 පෙබරවාරි මස 20 වන දින ඇති කර ගන්නාලද ගිවිසුම් ප්‍රකාශයෙහි මෙහි උපලේඛනයෙහි සඳහන් වන එකී ගිවිසුම ප්‍රකාශයෙහි අදාළ වගන්තිවල නියමයන් බලාත්මක කිරීමට අවශ්‍ය වන ප්‍රමාණයට ඉහත කී පනතේ විධිවිධාන කොළඹ සැළසුම් කාර්යාංශයට අදාළ විය යුතු යැයි මෙම නියමය මඟින් ප්‍රකාශයට පත් කරමි.

මංගල සමරවීර පා.ම,
විදේශ කටයුතු අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

**ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවට සහ කොළඹ සැළසුම් කාර්යාංශය සමග ඇති කරගනු ලැබූ ගිවිසුම් ප්‍රකාශය**

*1 වැනි වගන්තිය*

*කාර්යාංශයේ තත්ත්වය*

1. (මෙහි මින් මතු කාර්යාංශය යනුවෙන් හඳුන්වනු ලබන) කොළඹ සැළසුම් කාර්යාංශය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දේශය තුළ අධිකරණ පුද්ගලතාවයක් භුක්ති විදිය යුතු අතර, එය විසින් ජාත්‍යන්තර හා අන්තර් රාජ්‍ය සංවිධානයන්ගේ දූත මණ්ඩලවලට ලබා දී ඇති සමාන තත්ත්වය භුක්ති විදිය යුතුය.ගිවිසුම්වලට ඇතුළත්වීමට ද, නිශ්චල හා චංචල දේපළ අත්පත් කර ගැනීමට හා නියාදනය කිරීමට ද, නීතියට අනුව නඩු පැවරීමට ද ශක්නුතාවය එයට තිබිය යුතුය.

2. මෙම ගිවිසුම මගින් එයට ලබා දී ඇති වරප්‍රසාද හා මුක්තීන් කාර්යාංශය විසින් භුක්ති විදිය යුතුය.

*2 වන වගන්තිය*

*කාර්යාංශයේ මුක්තීන් හා වරප්‍රසාද*

1. කාර්යාංශය, එහි දේපළ සහ වත්කම් කොතැනක පිහිටා තිබුණ ද, කවුරුන් විසින් දරනු ලැබූව ද යම් විශේෂිත කරුණක දී එහි මුක්තිය ප්‍රකාශිත වශයෙන් අත්හැර ඇති ප්‍රමාණයට හැර, සියලුම නෛතික ක්‍රියාවලීන්ගෙන් මුක්තිය ලැබිය යුතුය. කෙසේ වෙතත් කිසිම මුක්ති අත්හැරීමක් ඇස්කිසි කිරීමක් දක්වා යම් ප්‍රමාණයකට ව්‍යාප්ත කිරීමක් ලෙස අදහස් නොකෙරේ.

2. කාර්යාංශයේ කාර්යාලය අලංඝනීය විය යුතුය. කාර්යාංශයේ දේපළ සහ වත්කම් කොතැනක පිහිටා තිබුණ ද, කවුරුන් විසින් දරමින් සිටිය ද යම් විශේෂිත කරුණක දී එහි මුක්තීන් ප්‍රකාශිත වශයෙන් අත්හැර ඇති ප්‍රමාණයට හැර, සෝදිසි කිරීමෙන්, අත්කර ගැනීමෙන් රජසතු කිරීමෙන්, අපසර්ජනයෙන් සහ විධායක පරිපාලනමය අධිකරණ හෝ ව්‍යවස්ථාදායක වූ හෝ වෙනත් ආකාරයේ අතුරු බාධකයන්ගෙන් මුක්ත විය යුතුය.

3. කොතැනක තිබුන ද කාර්යාංශයේ පැරණි ලේඛණාගාරය සහ පොදුවේ එයට අයත් හෝ ඒ මගින් දරා සිටින සියලුම ලේඛන අලංඝනීය විය යුතුය.

4. යම් ආකාරයේ මූල්‍යමය/පාලනයන් විධිමත් කිරීම් හෝ විලම්බිත කාලයන් මගින් සීමා කිරීමකින් තොරව-

(අ) කාර්යාංශය විසින් අරමුදල් හෝ ඕනෑම වර්ගයක මුදල් දරා සිටීම සහ ඕනෑම මුදලකින් ගිණුම් පවත්වාගෙන යාම කළ හැකිය.

(ආ) කාර්යාංශයේ අරමුදල් හෝ මුදල් ශ්‍රී ලංකාවෙන් පිටත යම් වෙනත් රටකට මාරු කිරීමට සහ ප්‍රතිලෝම වශයෙන් එසේ කිරීමට හෝ ශ්‍රී ලංකාව තුළ එසේ කිරීමට සහ එමගින් දරනු ලබන යම් මුදලක් වෙනත් යම් මුදලකට හැරවීමට එයට නිදහස තිබිය යුතුය. එතෙකුදු වුවත්, ශ්‍රී ලංකාවේ දී අත්පත් කරගනු ලැබූ අරමුදල් හෝ මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් වූ අරමුදල් හෝ මුදල් මාරුකිරීමේ දී හා හැරවීමේ දී නීතියෙන් නියම කර ඇති යම් සීමාකිරීම්වලට යටත් විය හැකි ය.

5. කාර්යාංශය, එහි වත්කම් සහ අනෙකුත් දේපළ -

(අ) සියලු ඍජු අයබදුවලින් නිදහස් කළ යුතු ය. කෙසේ වෙතත්, පොදු උපයෝගිතා සේවාවන් සඳහා අයකරනු ලබන වරිපනම් හා අයබදුවලින් නිදහස් කරන ලෙස කාර්යාංශය විසින් ඉල්ලා සිටින බවත් එයින් අදහස් නොකෙරේ.

(ආ) කාර්යාංශය විසින් එහි නිල කාර්යයන් සඳහා ආනයනය හෝ අපනයනය කරනු ලබන භාණ්ඩ වෙනුවෙන් තීරුබදු හා බදු අයකිරීමෙන් නිදහස් කළ යුතුය. කෙසේ වෙතත්, එවැනි නිදහස් කිරීම් යටතේ ආනයනය කරනු ලැබූ භාණ්ඩ ප්‍රතිඅපනයනය කළයුතු අතර,ශ්‍රී ලංකා ආණ්ඩුවේ පූර්ව අනුමතියක් නොමැතිව ශ්‍රී ලංකාව තුළ විකිණීම නොකළ යුතු බව අදහස් කෙරේ. ශ්‍රී ලංකාව තුළ විකුණනු ලැබුවේ නම් එවැනි භාණ්ඩ සාමාන්‍ය තීරු ගාස්තු හා බදුවලට යටත් වන්නේය.

(ඇ) එහි ප්‍රකාශන ආනයනයන් හා අපනයනයන් තීරු බදුවලින් හා බදුවලින් ද, තහනම් කිරීම් හා සීමා කිරීම්වලින් ද නිදහස් විය යුතුය.

6. ප්‍රමුඛත්වය පිළිබඳ කරුණු , තැපැල, කේබල් පණිවුඩ, විදුලි පණිවුඩ, විදුලි ඡායාරූප, දුරකථන හා අනෙකුත් පණිවුඩ හුවමාරුවල දී සහ පුවත්පත්, ගුවන් විදුලිය හා රූපවාහිනිය මගින් තොරතුරු ලබාදීම සඳහා ප්‍රචාරක ගාස්තු වෙනුවෙන් ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනට ප්‍රදානය කර ඇති ප්‍රමාණයට වඩා අවාසිදායක නොවන සැලකිල්ලක් කාර්යාංශයට හා එහි නිල සංදේශන කටයුතුවල දී භුක්ති විඳීමට ඉඩදිය යුතුය. කාර්යාංශයේ නිල ලිපි හුවමාරු හා අනෙකුත් සංදේශගත කටයුතු වෙනුවෙන් ප්‍රවෘත්ති පාලනයක් නොකළ යුතුය.

7. කාර්යාංශයට සංකේත භාවිතයටත් පණිවුඩකරුවන් හෝ මලු මගින් එහි ලිපි හුවමාරු කර ගැනීමටත් කාර්යාංශයට අයිතිය තිබිය යුතු අතර, ඒ සඳහා ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් කාර්යාලය සඳහා ලබා දී ඇති සමාන මුක්ති හා වරප්‍රසාදයන් තිබිය යුතුය.

8. ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් කාර්යාලයට සහ එහි දේපළ ,අරමුදල් හා වත්කම් සඳහා ලබා දී ඇති වෙනත් එවැනි වරප්‍රසාද හා මුක්තීන් ද තිබිය යුතුය.

*3 වැනි වගන්තිය*

අධ්‍යක්ෂවරයාගේ මුක්ති හා වරප්‍රසාද එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ එක්සත් ජාතීන්ගේ නේවාසික නියෝජිතයාට ලබා දී ඇති මුක්තීන් හා වරප්‍රසාදවලට සමාන තත්ත්වයක් අධ්‍යක්ෂවරයාට තිබිය යුතුය.

*4 වැනි වගන්තිය*

*කාර්යාංශයේ නිලධරයන්ගේ මුක්ති හා වරප්‍රසාද*

1. කාර්යාංශයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට මෙම කොටස අදාළ වේ. කාර්යාංශය වෙනුවෙන් දූත මෙහෙවරෙහි යෙදෙන විශේෂඥයන්ට ඔවුන්ගේ කාර්යයන් ස්වාධීනව ඉටු කිරීමට අවශ්‍ය වන යම් වරප්‍රසාද හා මුක්තීන් ඔවුන් දූත මෙහෙවරෙහි යෙදෙන කාලසීමාව තුළ දී මෙම කොටස යටතේ ලබා දිය යුතුය.

(111) සිට (V) දක්වා වගන්ති පුරවැසියනට හා ශ්‍රී ලංකාවේ නිත්‍ය නේවාසිකයන්ට අදාළ නොවේ.

(I) ඔවුන්ගේ නිල ශක්නුතාවය තුළ ඔවුන් විසින් ප්‍රකාශ කරනු ලැබූ හෝ ලියනු ලැබූ වචන සහ කරනු ලැබූ ක්‍රියාවන් සම්බන්ධයෙන් හැම ආකාරයේම නෛතික ක්‍රියාවලියෙන් මුක්ත වීම.

(II) කාර්යාංශයෙන් ඔවුන්ට ගෙවනු ලබන වැටුප් හා පඩිනඩි මත අයබදුවලින් නිදහස් කිරීම.

(III) ඔවුන් ද, ඔවුන්ගේ කලත්‍රයන් සහ යැපෙන ඥාතීන් ද ආගාමික සීමාකිරීම්, පරදේශීන් ලියා පදිංචි කිරීම් සහ ජාතික සේවා බන්ධනයන්ගෙන් නිදහස් කිරීම.

(IV) ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් කාර්යාලයේ නිලධර කොටස්වල සමාන පදවි දරන්නන්ට ලබා දී ඇති විනිමය පහසුකම් සඳහා වූ සමාන වරප්‍රසාදයන් ලබාදීම.

(V) ජාත්‍යන්තර අර්බුදයන් පවත්නා අවස්ථාවක දී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ කාර්යාලයේ කාර්ය මණ්ඩලයට දෙනු ලබන සමාන නිත්‍ය රටවැසි භාවය අත්හැරීමේ පහසුකම් සඳහා අයිතිය ඔවුන්ගේ කලත්‍රයන් හා යැපෙන ඥාතීන් ද ඇතුළුව ඔවුන්ට ලබාදීම.

(VI) මෙහි ඇමුණුමේ දැක්වෙන පරිදි තීරු ගාස්තු සහ ආනයන බදු හා අයබදු සම්බන්ධයෙන් වරප්‍රසාද පහසුකම්.

(VII) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහනේ ශ්‍රී ලංකා කාර්යාලයේ සමාන පදවි දරන නිලධරයන්ට ලබාදෙන වෙනත් එවැනි වරප්‍රසාද හා මුක්තීන් .

2. මෙම කොටස අදාළ විය යුතු තැනැත්තන්ගේ නම් අධ්‍යක්ෂවරයා විසින් ශ්‍රී ලංකා ආණ්ඩුවට කලින් කලට දැන්විය යුතුය. ශ්‍රී ලංකා ආණ්ඩුව සහ අධ්‍යක්ෂවරයා කලින් කලට ඔවුනොවුන් විමසා කාර්යාංශයේ කාර්ය මණ්ඩලයේ ප්‍රමාණය පිළිබඳව නිශ්චයනයකට එළඹිය යුතුය.

*5 වැනි වගන්තිය*

*වරප්‍රසාද හා මුක්තීන් අත්හැරීම*

කාර්යාංශයට, අධ්‍යක්ෂවරයාට සහ කාර්යාංශයේ නිලධරයන්ට ද, කාර්යාංශය වෙනුවෙන් දූත මෙහෙවරෙහි යෙදෙන විශේෂඥයන්ට වරප්‍රසාද හා මුක්තීන් ලබාදිය යුත්තේ ඔවුන්ගේ පෞද්ගලික වාසි සඳහා නොව කාර්යාංශයේ යහපත උදෙසාය. ඒ අනුව , කෙසේ වෙතත්, යුක්තිය පසිඳලීමේ ක්‍රියා මාර්ග අවහිර වනවිට කාර්යාංශයේ අධ්‍යක්ෂවරයාට කාර්යාංශය හා එහි කාර්ය මණ්ඩලය වෙනුවෙන් එවැනි මුක්තියක් අත්හැරීමට අයිතිය හා යුතුකම් ඇති අතර, කාර්යාංශයේ යහපතට අගතියක් නොවන පරිදි අත්හැරීම කළ හැකිය.

*7 වැනි වගන්තිය*

*සහයෝගිතා පිළිවෙත්*

නියමාකාරයෙන් යුක්තිය පසිඳලීම, විශේෂයෙන්ම ජාතික ආරක්ෂාවට අදාළ නීති හා නියමයන් පිළිපදින බව සුරැකීම සහ කාර්යාංශයට හා එහි නිලධරයන්ට ලබා දී ඇති වරප්‍රසාද, මුක්ති සහ පහසුකම් පිළිබඳව යම් අනිසි භාවිතයක් සිදුවීම වැළැක්වීම පහසුකරලීම සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුවේ නිසි බලධාරීන් සමග අධ්‍යක්ෂවරයා සහයෝගයෙන් කටයුතු කළ යුතුය.

කාර්යාංශයේ කාර්යාලයයන් එහි නිල කටයුතු ක්‍රියාවේ යෙදවීමට නොගැලපෙන යම් ආකාරයකින් භාවිතා කිරීම නොකළ යුතුය.

*ඇමුණුම*

**තීරු බදු ගාස්තු සහ ආනයන බදු පිළිබඳ වරප්‍රසාද සහ සහන**

තම රටින් බැහැර සිටින කාර්යාංශයේ නිලධාරීන්ට පමණක් උපයෝගී වන මේ කොටස, ජාත්‍යන්තර වශයෙන් සේවයට බඳවා ගනු ලැබ තම රාජකාරී කටයුතු කරගෙන යාම සඳහා හය මාසයකට හෝ ඊට වැඩි කාලයකට හෝ ශ්‍රී ලංකාවේ පදිංචි වී සිටින්නේ නම් මිස නැත්නම් ශ්‍රී ලංකාවේ පුරවැසියන් සහ ස්ථිර පදිංචිකරුවන් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතුයි.

මේ කොටස උපයෝගී වන තැනැත්තන්ට බදු සහ තීරු ගාස්තුවලින් නිදහස් ව,ඇප තැබීමකින් තොරව පහත දැ ආනයනය කිරීමට අයිතිවාසිකම් ඇත.

1. ශ්‍රී ලංකාවේ තනතුරු බාර ගෙන හය මාසයක් ඇතුළත, ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් (යූඑන්ඩීපී) කාර්යාලයේ සමාන තරාතිරමේ නිලධාරීන්ට දෙනු ලබන පදනම මත ම, තමන්ටත් තම පවුලේ අයටත් පෞද්ගලික පරිහරණය සඳහා එක් මෝටර් රියක් ද, ගෘහභාණ්ඩ සහ ගේදොර බඩු මුට්ටු සීමිත ප්‍රමාණයක් ද,

2. පෞද්ගලික පරිහරණය සඳහා, පවුල සමග පැමිණ සිටින විවාහක තැනැත්තෙකුට නම් මාසයකට නැව තෙක් නොමිලේ ඇමෙරිකන් ඩොලර් 250ක් ද, අවිවාහකනම් හෝ විවාහක එහෙත් පවුලේ අය තමන් සමග පැමිණ නැති අයෙකු නම් හෝ මාසයකට නැව තෙක් නොමිලේ ඇමෙරිකන් ඩොලර් 175ක් ද වන වටිනාකමකින් යුත් ආහාර ද්‍රව්‍ය, සිගරැට් සහ දිනපතා පරිභෝජනය සඳහා අවශ්‍ය වෙනත් පාරිභෝගික ද්‍රව්‍ය.

3. පෞද්ගලික පරිහරණය සඳහා , හෝ පවුලේ ප්‍රයෝජනය සඳහා හෝ වන ගේදොර බඩු මුට්ටු ප්‍රතියෝජනය සඳහා හෝ අමතර සීමිත ප්‍රමාණ ආනයනය සඳහා හෝ කෙරෙන ඉල්ලීම් කෙරෙහි එක් එක් ප්‍රස්ථාවයේ හැටියට අදාළ ශ්‍රී ලංකා බලධාරීන් විසින් නිසි පරිදි සළකා බලනු ඇත.

   එබඳු බඩු මුට්ටුවලට පහත දැ ඇතුළත් කළ හැකි ය.-

   (අ) එක් නිවසකට එක් මෝටර් රියක්. එක් ශීතකරණයක්, එක් අධි ශීතකරණයක් එක් උඳුනක්, එක් රෙදි සෝදනයක්, එක් පිඟන් කෝප්ප සෝදනයක් , එක් ගුවන් විදුලි යන්ත්‍රයක්, එක් තැටි වාදකයක්,එක් ටේප් රෙකෝඩරයක්, එක් රූපවාහිනියක්, එක් වීඩියෝ රෙකෝඩරයක් , සුළු විදුලිය උපකරණ සහ

   (ආ) එක් එක් තැනැත්තා සඳහා වායු සමීකරණයක්, ඡායාරූප උපකරණ මෙවලමක්,සිනමා උපකරණයක්, එක් ගුවන්විදුලි සහ කැසට් රෙකෝඩරයක්

එසේ ආනයනය කරනු ලබන මෝටර් රිය සාමාන්‍යයෙන් නැවත අපනයනය කළ යුතු අතර ශ්‍රී ලංකා රජයේ පූර්ව අවසරය නොමැතිව ශ්‍රී ලංකාව තුළ විකුණනු නොලැබිය යුතු ද වේ.ශ්‍රී ලංකාව තුළ විකුණනු ලබන්නේ නම් මේ ඡේදයේ සඳහන් බඩුබාහිරාදිය සාමාන්‍ය බදු සහ තීරුගාස්තු රඟවීමට යටත් වනු ඇත.

10-712/4

---

**1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනත**

4 වැනි වගන්තිය යටතේ නියමය

1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, විදේශ අමාත්‍ය මංගල සමරවීර වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සමග 1988 මාර්තු මස 21 වැනි දින ඇති කර ගන්නා ලද ගිවිසුමෙහි මෙහි උපලේඛනයෙහි සඳහන් වන එකී ගිවිසුමේ අදාළ වගන්තිවල, නියමයන් බලාත්මක කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රමාණයට ඉහත කී පනතේ විධි විධානයන් ජාත්‍යන්තර කම්කරු සංවිධානයට අදාළ විය යුතු යැයි මෙම නියමය මගින් ප්‍රකාශයට පත් කරමි.

මංගල සමරවීර පා.ම.<br>
විදේශ කටයුතු අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 30 වැනි දින,<br>
කොළඹ දී ය.

**උපලේඛනය**

**ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ කාර්යාලයයක් කොළඹ පිහිටුවීම සඳහා, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානය අතර ඇති කරගන්නා ලද ගිවිසුම**

***11 වැනි වගන්තිය***

1. විශේෂිත ආයතන සඳහා වරප්‍රසාද හා මුක්ති පිළිබඳ 1947 නොවැම්බර් මස 21 වැනි දිනැති සම්මුතියෙහි ද, 1948 ජූලි මස 10 වැනි දිනැති එහි ඇමුණුමේ ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙනුවෙන් සලස්වා ඇති වරප්‍රසාද හා මුක්ති, ආණ්ඩුව විසින් කොළඹ පිහිටි ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ කාර්යාලයට ද, එකී කාර්යාලයේ කාර්ය මණ්ඩලයට මෙන්ම, ඉහත කී සම්මුතියෙහි හා එහි ඇමුණුමෙහි සඳහන් යම් තැනැත්තන්ට ඔවුන් නිල කටයුතු සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට පැමිණෙන අවස්ථාවල දී ද, ලබාදෙනු ඇත.

2. කොළඹ පිහිටි ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ කාර්යාලයටත් ඉහත 1 වන ඡේදයේ සඳහන් කළ සියළුම තැනැත්තන්ටත්, ආණ්ඩුව විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ වෙනත් යම් අන්තර් රාජ්‍ය සංවිධානයකට සහ එහි කාර්ය මණ්ඩලයට දෙනු ලබන වරප්‍රසාද හා මුක්තීන්ට අඩු නොවන වරප්‍රසාද මුක්තීන් ලබාදෙනු ඇත.

10-712/5

---

**1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනත**

4 වැනි වගන්තිය යටතේ නියමය

1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, විදේශ අමාත්‍ය මංගල සමරවීර වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සමග 1990 ජූනි මස 16 වන දින ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට හා එහි ශ්‍රී ලංකාවේ සිටින නියෝජිත මණ්ඩලයට මුක්තීන් වරප්‍රසාද හා පහසුකම් ප්‍රදානය කිරීම් සඳහා වූ තත්ත්ව ගිවිසුමෙහි, මෙහි උපලේඛනයෙහි සඳහන් වන ගිවිසුමේ අදාල වගන්තිවල,නියමයන් බලාත්මක කිරීමට අවශ්‍ය වන ප්‍රමාණයට ඉහත කී පනතේ විධිවිධාන ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට අදාළ විය යුතු යැයි මෙම නියමය මගින් ප්‍රකාශයට පත් කරමි.

මංගල සමරවීර පා.ම.<br>
විදේශ කටයුතු අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 30 වැනි දින,<br>
කොළඹ දී ය.

**උපලේඛනය**

ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට සහ එහි ශ්‍රී ලංකාවේ සිටින නියෝජිත මණ්ඩලයට මුක්තීන්, වරප්‍රසාද හා පහසුකම් ප්‍රදානය කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව (ශ්‍රී ලංකා ආණ්ඩුව) සහ ජාත්‍යන්තර රතු කුරුස කමිටුව සමග ඇතිකර ගනු ලැබූ තත්ත්ව ගිවිසුම.

*1 වැනි වගන්තිය*

*නියෝජිත පිරිසේ තත්ත්වය*

1. ජාත්‍යන්තර රතු කුරුස කමිටුව සහ එහි නියෝජිත මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දේශය තුළ නෛතික පුද්ගලත්වයක් භුක්ති විඳිය යුතු අතර ජාත්‍යන්තර දූත මණ්ඩලවලට හා අන්තර් රාජ්‍ය සංවිධානවලට ලබා දී ඇති සමාන තත්ත්වයන් භුක්ති විඳිය යුතුය.

2. ජාත්‍යන්තර රතු කුරුස කමිටුව සහ එහි නියෝජිත මණ්ඩලය විසින් මෙම ගිවිසුමෙන් ලබා දී ඇති වරප්‍රසාද හා මුක්තීන් භුක්ති විඳිය යුතුය.

3. ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නියෝජිත මණ්ඩලය සහ එහි දේපළ, යම් විශේෂ කරුණක දී ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නියෝජිත මණ්ඩලය විසින් මෙම මුක්තිය අත්හැර ඇතිතාක් දුරට හැර, නෛතික හෝ පරිපාලන බලාධිකාරයෙන් මුක්තවිය යුතුය.

4. ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නියෝජිත මණ්ඩල කාර්යාලයයන්, ගුදම් සහ අනෙකුත් පරිශ්‍රයන් ද ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ වාහන මෙන්ම එහි වාර්තා ලේඛන, ලිපි, දේපළ,වත්කම් සහ අරමුදල් ද අලංඝනීය විය යුතුය. ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ කැමැත්ත ඇතිව මිස, ඒවා සෝදිස කිරීමෙන්, අධිග්‍රහණයෙන්, රජසතු කිරීමෙන් අපසර්ජනයෙන්, සහ විධායක,පරිපාලනමය, අධිකරණ හෝ ව්‍යවස්ථාදායක වූ වෙනත් ආකාරයේ බාධකයන්ගෙන් මුක්ත විය යුතුය.

*2 වැනි වගන්තිය*

*දේපළ හා අරමුදල්*

1. ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නියෝජිත මණ්ඩලය සියළුම ප්‍රාදේශීය, නාගරික, පළාත්බද හෝ ජාතික බදු හා අයබදු වලින් නිදහස් විය යුතුය.කෙසේ වෙතත් ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නියෝජිත මණ්ඩලය විසින් පොදු උපයෝගිතා සේවාවන් සඳහා අයකරනු ලබන ගාස්තුවලින් නිදහස් කරන ලෙස ඉල්ලා නොසිටිය යුතුය.

2. අදාල නීති, නියෝග හා නියමයන්හි විධිවිධානවලට යටත්ව, ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නියෝජිත මණ්ඩලය එහි ක්‍රියාවලියට අවශ්‍ය වන සියලුම විෂයාංකයන් ආනයනය හා අපනයනය කිරීම සම්බන්ධයෙන් තීරු ගාස්තු හා අයබදුවලින් නිදහස් කළ යුතුය. කෙසේ වෙතත් එවැනි නිදහස් කිරීම් මත ආනයනික භාණ්ඩ ශ්‍රී ලංකා ආණ්ඩුවත් සමඟ ගිවිසගත් නියමයන් යටතේ මිස, ශ්‍රී ලංකාව තුළ විකුණනු නොලබන බව එයින් අදහස් කෙරේ.

3. අදාළ නීති, නියෝග හා නියමයන්හි විධිවිධානවලට යටත්ව, ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නියෝජිත මණ්ඩලය විසින් ඕනෑම මුදලකින් අරමුදල් හා ගිණුම් දරා සිටිය හැකි අතර, ශ්‍රී ලංකාව තුළ තැනින් තැනට වෙනත් රාජ්‍යයකට ඒවා මාරු කිරීම කළ හැකිය.

4. අදාළ නීති, නියෝග හා නියමයන්හි විධිවිධානවලට යටත්ව, ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නියෝජිත මණ්ඩලය එහි අරමුදල් සීමාවකින් තොරව ඕනෑම මුදලකට මාරු කළ හැකිය.

5. නියෝජිත මණ්ඩලයේ නිල ප්‍රයෝජනය සඳහා මෝටර් රථයක් ආනයනය කිරීම සඳහා ජාත්‍යන්තර රතු කුරුස කමිටුව සියලු බදුවලින් හා තීරු බදුවලින් නිදහස් කළ යුතුය. අතිරේක මෝටර් රථ ආනයනය කිරීම වෙනුවෙන් ආණ්ඩුව විමසා පූර්ව අවසරය ලබා ගැනීමට යටත්වනු ඇත. ආණ්ඩුවේ අවසරය නොමැතිව නියෝජිත මණ්ඩලයේ සියලුම මෝටර් රථ නැවත විකිණීම නොකළ යුතුය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ පවත්නා නීති හා නියෝගවලට යටත්ව මෝටර් රථ ප්‍රතිඅපනයනය කළ හැකිය.

*3 වැනි වගන්තිය*

*සහනාධාර සැපයීම*

1 ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ සහනාධාර වැඩසටහන්වලට හෝ දේශීය රතු කුරුස සංවිධානයට හෝ වෙනත් මානව හිතවාදී සංවිධානවලට කරනු ලබන සහනාධාර සැපයීම් ආනයනය,අපනයනය සහ ප්‍රතිනැවිගත කිරීම වෙනුවෙන් ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නියෝජිත මණ්ඩලය අයබදු සහ තීරුබදුවලින් නිදහස් කළ යුතු අතර, සියලුම සීමාකිරීම් හා තහනම් කිරීම්වලින් නිදහස් විය යුතුය.

2 ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නියෝජිත මණ්ඩලය සහනාධාර සැපයීමේ දී සනීපාරක්ෂාව, ආරක්ෂාව සහ වාණිජ ව්‍යවහාරයන් පිළිබඳ ජාතික ව්‍යවස්ථාපිත විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය.

3 ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නියෝජිත මණ්ඩලය විසින් ආණ්ඩුවේ අනුමැතිය සහ ආණ්ඩුව විසින් නියම කරනු ලැබූ කොන්දේසි යටතේ මිස තීරුබදුවලින් නිදහස්ව මෙරටට ආනයනය කරනු ලැබූ භාණ්ඩ මෙරටෙහි විකිණීම නොකළ යුතුය.

4 ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නියෝජිත මණ්ඩලය විසින් සහන කටයුතු පවතින අවස්ථාවල බෙදා හරින භාණ්ඩ ගබඩා කිරීම සඳහා, එවැනි භාණ්ඩ අදාළ තහවුරු කිරීමේ ලේඛන මගින් රතු කුරුස කමිටුවට අයිති බව හඳුනාගනු ලබන්නේ නම් ආණ්ඩුව සමග වූ පූර්ව විමසීම් හා සම්බන්ධීකරණය ඇතිව හිස් ගුදම් ලබා ගැනීම කළ හැකිය.

*4 වැනි වගන්තිය*

*සන්දේශනය*

1. ප්‍රමුඛත්වය පිළිබඳ කරුණු, තැපැල,කේබල් පණිවුඩ,විදුලි පණිවුඩ, ගුවන් විදුලි පණිවුඩ , දුරකථන හා අනෙකුත් පණිවුඩ හුවමාරුවල දී සහ පුවත්පත්, ගුවන් විදුලිය හා රූපවාහිනී මගින් තොරතුරු ලබාදීම වෙනුවෙන් ප්‍රචාරක ගාස්තු ආදිය ජාතික විදුලි සංදේශ ව්‍යවස්ථාවන්ට අනුව, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් යම් විදේශ දූත මණ්ඩලයකට ලබාදී ඇති ප්‍රමාණයට වඩා අවාසිදායක නොවන සැලකිල්ලක් නිල පණිවුඩ හුවමාරු කටයුතුවල දී ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නියෝජිත මණ්ඩලයට භුක්ති විඳීමට ඉඩ දිය යුතුය.

2. ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නියෝජිත මණ්ඩලයේ නිල ලිපි හුවමාරු හා සන්දේශනයන් සඳහා ප්‍රවෘත්ති පාලනයක් නොතිබිය යුතුය. ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නිල ප්‍රකාශන, කලින් කලට ජාත්‍යන්තර රතු කුරුස කමිටුව වෙතින් හෝ වෙතට යවනු ලබන ඡායාරූපික හෝ සිනමා චිත්‍රපට,ඡායාරූප හා ශ්‍රව්‍ය දෘශ්‍ය වාර්තාවලට සහ රටේ ජාතික ව්‍යවස්ථාවලට අනුව එමගින් සංවිධානය කරනු ලබන ප්‍රදර්ශනවල භාණ්ඩ සඳහා ද මෙම මුක්තිය අදාල විය යුතුය.

3. ජාත්‍යන්තර රතු කුරුස කමිටුව විසින් එවැනි ක්‍රමයක් භාවිත කිරීම අවශ්‍ය අවස්ථාවක,ජිනීවා මූලස්ථානය සහ ශ්‍රී ලංකා නියෝජිත මණ්ඩලය අතර හෝ ශ්‍රී ලංකා නියෝජිත මණ්ඩලය සහ වෙනත් රටවල ඇති නියෝජිත මණ්ඩලයක් හෝ නියෝජිත මණ්ඩල අතර සහ ජාතික දේශය තුළ ක්‍රියාත්මකව ඇති ක්ෂේත්‍ර ඒකකයන් අතර ගුවන් විදුලි මගින් සංකේත රහිත පණිවුඩ සම්ප්‍රේෂණය කළ හැකි නමුත් මෙම සංකේත රහිත පණිවුඩ මගින් වර්ග කරනු ලැබූ කරුණු සම්ප්‍රේෂණය නොකළ යුතුය.

4. එවැනි සියලු සන්දේශගත කාර්යයන් සඳහා ජාත්‍යන්තර විදුලි සන්දේශ සංගමය මගින් මේ සඳහා ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට වෙන්කර දී ඇති සංඛ්‍යාතයන් භාවිත කළ යුතුය. මේ සඳහා, ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නියෝජිත මණ්ඩලය විසින් නියෝජිත මණ්ඩලයට අයත් පරිශ්‍රයෙහි අවශ්‍ය ගුවන් විදුලි උපකරණ ස්ථාපනය කළ හැකි අතර, ජාතික විදුලි සංදේශ පරිපාලනයෙන් අවශ්‍ය බලපත්‍ර ලේඛන ලබා ගැනීමෙන් පසුව ජාතික දේශය තුළ ජංගම උපකරණ භාවිත කළ හැකිය.

5. ආණ්ඩුව හා ජාත්‍යන්තර රතු කුරුස කමිටුව අතර එකගත්වයට පැමිණෙන ආකාරයට සන්දේශනය පිළිබඳව සුදුසු ආරක්ෂණ පූර්වෝපායයන් යොදා ගැනීමෙන් වැලකෙන බව මෙම වගන්තියෙහි සඳහන් කිසිවකින් අදහස් කරන බවත් තේරුම් නොගත යුතුය.

*5 වැනි වගන්තිය*

*ජාත්‍යන්තර රතු කුරුස කමිටුව සහ පරදේශීය සේවා නියුක්තියන්*

1. ශ්‍රී ලංකා ආණ්ඩුවක් ජාත්‍යන්තර රතු කුරුස කමිටුවත් ඔවුනොවුන් විමසා ශ්‍රී ලංකාවේ රතු කුරුස කමිටුවේ නියෝජිත මණ්ඩලයේ ක්‍රියාකාරකම් ගැන සලකා බලා ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ ශ්‍රී ලංකා නියෝජිත මණ්ඩලයේ ප්‍රමාණය කලින් කලට නිශ්චයනය කළ යුතුය.

2. ජාත්‍යන්තර රතු කුරුස කමිටුව විසින් ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ සියලු නියෝජිතයන්ගේ හා පරදේශික සේවා නියුක්තයන්ගේ පැමිණීමේ දිනය ආපසු ගිය දිනය හෝ කාර්යයන් අවසන් කළ දිනය විදේශ අමාත්‍යාංශය වෙත දැන්විය යුතුය.

3. අර්ථ නිරූපනයට අනුව ස්විස් ජාතිකයන් සහ විදේශීය සේවා නියුක්තයන් වන ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නියෝජිතයන් ඔවුන්ගේ කලත්‍රයන් සහ ඔවුන්ගේ පවුල්වල යැපෙන සාමාජිකයන් විසින් ජාත්‍යන්තර සහ අන්තර් රාජ්‍ය සංවිධානවල දූත මණ්ඩලවල සාමාජිකයන්ට හා සේවා නියුක්තයන්ට ලබා දී ඇති තත්ත්වයට සමාන තත්ත්වයන් භුක්ති විඳිය යුතු අතර වර්තමාන ගිවිසුමේ දක්වා ඇති වරප්‍රසාද හා මුක්තීන් ද භුක්ති විඳිය යුතුය.

4. ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නියෝජිතයන් සහ පරදේශික සේවා නියුක්තයන් -

   (අ) ඔවුන්ගේ නිල කාර්යයන් ඉටුකිරීමේ දී කරන ලද ක්‍රියාවන් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ අධිකරණ හෝ පරිපාලන බලධාරීන්ගේ බලාධිකාරයෙන් මුක්ත විය යුතුය.

   (ආ) ඔවුන්ගේ නිල කාර්යයන්ට අදාල කරුණු සම්බන්ධයෙන් සාක්ෂිකරුවන් වශයෙන් සාක්ෂිදීමට බැඳී නොසිටිය යුතුය.

   (ඇ) ජාත්‍යන්තර රතු කුරුස කමිටුව මගින් ඔවුන්ට ගෙවනු ලබන වැටුප් හා පඩිනඩි අයබදු පැනවීමෙන් නිදහස් විය යුතුය.

   (ඈ) ඔවුන්ගේ කලත්‍රයන් සහ ඔවුන්ගේ පවුල්වල යැපෙන සාමාජිකයන් ද ඇතුළුව ඔවුන්ට ආගාමික සීමාකිරීම් සහ විදේශික ලියාපදිංචි කිරීම අවශ්‍යතාවයන්ගෙන් සහ ජාතික සේවා බන්ධනයන්ගෙන් මුක්ත විය යුතුය.

   (ඉ) ජාත්‍යන්තර හා අන්තර් රාජ්‍ය සංවිධානවල දූත මණ්ඩලවල සමාන පදවි දරන සාමාජිකයන්ට ලබා දී ඇති විධිමත් පහසුකම්වලට සමාන වරප්‍රසාදයන් ලබාදිය යුතුය.

   (ඊ) ජාත්‍යන්තර හා අන්තර් රාජ්‍ය සංවිධානවල දූත මණ්ඩලවල සාමාජිකයන්ට ජාත්‍යන්තර අර්බුදයක් පවත්නා අවස්ථාවකදී ප්‍රදානය කරනු ලබන සමාන රටවැසිභාවය ලබාගැනීමේ පහසුකම්. කලත්‍රයන් සහ ඔවුන්ගේ පවුල්වල යැපෙන සාමාජිකයන් ඇතුළුව ඔවුන්ට ලබාදිය යුතුය.

   (උ) ශ්‍රී ලංකාවේ ඔවුන්ගේ තනතුර ප්‍රථමයෙන් භාර ගන්නා අවස්ථාවේ ඔවුන්ගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ඔවුන් දේපළ, ගෘහ භාණ්ඩ, බඩුබාහිරාදිය, සහ ගෘහස්ථ උපකරණ නිදහසේ ආනයනය කිරීමට අයිතිය තිබිය යුතුය.

   (ඌ) ආපසු යන අවස්ථාවේ ඔවුන්ගේ දේපළ, ගෘහ භාණ්ඩ , බඩුබාහිරාදිය හා ගෘහස්ථ උපකරණ නිදහසේ අපනයනය කිරීමේ අයිතිය තිබිය යුතුය.

5. ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ සේවය කරන ශ්‍රී ලාංකිකයන් විසින් 4(අ) සිට 4(ඇ) ඡේද දක්වා හැර, මෙම වරප්‍රසාද හා මුක්තීන් භුක්ති නො විඳිය යුතු යැයි අදහස් කෙරේ.

6. 1 වගන්තියේ 4 වන ඡේදයේ විධිවිධාන ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නියෝජිතයන්ගේ හා විදේශික සේවා නියුක්තයන්ගේ නේවාසික ස්ථානයන්ට අදාළ විය යුතුය.

7. (අ) ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට මෙම වගන්තියෙහි දැක්වෙන වරප්‍රසාද හා මුක්තීන් ප්‍රදානය කර ඇත්තේ මානව හිතවාදී දූත මෙහෙයන් පහසුකිරීම සඳහා වන අතර එය පුද්ගලයන් සඳහා නොවේ. එබැවින්, ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට, එහි නියෝජිතයන්ට හා විදේශික සේවා නියුක්තයන්ට ඒවා ප්‍රදානය කර ඇත්තේ ඔවුන්ගේ කටයුතු හා කාර්යයන්හි යහපත උදෙසාය.

   (ආ) මුක්තීන් යුක්තිය පසඳලීමේ ක්‍රියා මාර්ගවලට අවහිරයක් වන්නේ යැයි ද ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ යහපතට අගතියක් නොවන ආකාරයට අත්හල හැකි බව ද ශ්‍රී ලංකා ආණ්ඩුවේ අදහස වන විට, යම් නියෝජිතයකුගේ මුක්තිය

අතහරින ලෙස ජාත්‍යන්තර රතු කුරුස කමිටුවෙන් ඉල්ලා සිටීමට ආණ්ඩුවට හැකිය. එවැනි අත්හැරීමක් හේතු සහගතවම ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ යහපතට අගතියක් නොවන ආකාරයට අත්හල ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට එම ඉල්ලීමට අනුකූලතාවය දැක්විය හැකිය.

8. මෙම වගන්තියෙහි දැක්වෙන වරප්‍රසාද හා මුක්තීන් යම් ආකාරයකින් අනිසි ලෙස භාවිතය වැළැක්වීම සඳහා ජාත්‍යන්තර රතු කුරුස කමිටුව හැමවිටම ශ්‍රී ලංකා ආණ්ඩුවත් සමඟ සහයෝගයෙන් ක්‍රියා කළ යුතුය.

*7 වැනි වගන්තිය*

*අවසාන විධිවිධාන*

1. යුක්තිය පසිඳලීම මනාව පවත්වාගෙන යාමටත්, පොලිස් නියෝග පිළිපදින බවට වගබලා ගැනීමත්, ජාත්‍යන්තර රතුකුරුස කමිටුවට ලබා දී ඇති වරප්‍රසාද මුක්ති සහ පහසුකම්වල යම් යම් අනිසි භාවිතයන් සිදුවීම වැළැක්වීම පහසු කිරීම සඳහා ජාත්‍යන්තර රතුකුරුස කමිටුව ශ්‍රී ලංකා ආණ්ඩුවේ නිසි බලාධිකාරයත් සමඟ සැමවිටම සහයෝගයෙන් ක්‍රියා කළ යුතු ය.

2. ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ කාර්යාලය එහි නිල කාර්යයන් ක්‍රියාත්මක කිරීමකට නොගැළපෙන යම් ආකාරයකින් භාවිත කිරීම නොකළ යුතු ය.

**1990, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ ජාත්‍යන්තර රතු කුරුස කමිටුව (ICRC) අතර ගිවිසුම සඳහා අතිරේකය**

1. ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ මෙන්ම එහි වර්තමාන හා හිටපු සේවාදායකයන් හා නියෝජිතයින්, ඔවුන් සිටින ස්ථානය නොසළකා, ඔවුන් වාචිකව හෝ ලිඛිතව හෝ ප්‍රකාශ කරන ලද වචන ආශ්‍රිතව එම නිලධාරීන්ගේ නිල වශයෙන් කටයුතු කිරීමේ දී ඔවුන් විසින් ඉටුකරන ලද සියලුම කටයුතු සම්බන්ධයෙන් ,
සාක්ෂිකරුවෙකු ලෙස හෝ සාක්ෂි ලබාදීමට වෙනත් ආකාරයේ නියම කිරීමකට කැඳවීමෙන් නිදහස් කළ යුතු ය. මෙම ඉහත කී නිදහස් කිරීම සියලු ආකාර වූ නීතිමය කටයුතුවල දී අදාළ කරගත යුතු ය.

2. නියෝජිත කණ්ඩායම් ප්‍රධානියා හා නියෝජිතයින් වාචිකව හෝ ලිඛිතව ලබාදුන් වචන ආණ්ඩුව නිල වශයෙන් සිදුකළ කටයුතුවල දී ඔවුන් විසින් ඉටුකරන ලද සියලුම කටයුතු සම්බන්ධයෙන්, ඔවුන්ගේ කාර්යය අවසාන වීමෙන් පසුව ප්‍රමාද නෛතික ක්‍රියාවලීන්ගෙන් විනිර්මුක්තිය ලැබීම ජාතිකත්වය නොසළකා හරිමින් භුක්ති විඳිය යුතු ය. ඔවුන්ගේ කාර්ය කටයුතු ඉටුකිරීම හේතු කොටගෙන ඔවුන් ඉගෙන ගන්නට ඇති කරුණු පිළිබඳව සාක්ෂි දීමෙන් නිදහස් කිරීම මෙම අධිකරණ පාත්‍රතාවයෙන් විනිර්මුක්තිය ලැබීමට ඇතුළත් වෙයි.

3. කුරියර් සේවාවක් හෝ මුද්‍රා තබන ලද ලිපි මලු මගින් ලියකියවිලි පිටත් කොටයැවීම හා ලබා ගැනීමේ අයිතිය ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට තිබිය යුතු ය. රාජ්‍ය තාන්ත්‍රික කුරියර් සේවාවට හා ලිපි මලුවට ලැබෙන විනිර්මුක්තීන් හා වරප්‍රසාදවලට සමාන විනිර්මුක්තීන් හා වරප්‍රසාද ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ කුරියර් සේවාවට හා ලිපි මලුවලට තිබිය යුතුය.

4. ජාත්‍යන්තර රතු කුරුස කමිටු වාර්තාවල ලිපිවල සහ වෙනස් සන්නිවේදන ද්‍රව්‍යවල මෙන්ම ජාත්‍යන්තර රතු කුරුස කමිටුව සමග ශ්‍රී ලංකා රජය සිදුකරන සන්නිවේදන කටයුතුවල අන්තර්ගතයන් හා වාර්තාවල රහස්‍යභාවයට ගරු කිරීමට ශ්‍රී ලංකා ආණ්ඩුව බැඳී සිටියි. ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ පූර්ණ කැමැත්ත නොමැතිව අපේක්ෂා කරනු ලබන ප්‍රතිග්‍රාහකයා හැර වෙනත් අයෙකුට එම කමිටුවේ අන්තර්ගතයන් හෙළි නොකිරීමටත් මෙම හෙළිදරව් කිරීම් සඳහා අවසර ලබානොදීම හෝ නෛතික කටයුතුවල දී භාවිතා නොකිරීම මෙම ගරු කිරීමට ඇතුළත් වෙයි.

5. ඉහත සඳහන් වරප්‍රසාද හා විනිර්මුක්තීන් හුදු අදහසින් ගත් කළ, අධිකරණ ක්‍රියාවලියට බාධා පමුණුවන්නේ නම් ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට ඒවා අත්හැරිය හැකි හා ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ අභිලාශයන්වලට අගතියක් නොවන පරිදි රජයට එම වරප්‍රසාද හා විනිර්මුක්තීන් ලබාදීම ඒවා අත්හිටුවිය හැකිය.

මෙවැනි අත්හැරීමක්,ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ සභාපතිවරයා විසින් හෝ එසේ කිරීමට බලය පවරා තිබෙන වෙනත් පුද්ගලයෙකු විසින් ලිඛිතව ලබාදීමෙන් පමණක් හෝ වලංගු භාවයට පත්විය යුතු ය.

**අංක 9 දරන තානාපති වරප්‍රසාද පනත**

4 වන වගන්තිය යටතේ නියමය

1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර විදේශ අමාත්‍ය මංගල සමරවීර වන මම.ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සමඟ 1993 ජනවාරි මස 18 වන දින ඇති කර ගනු ලැබූ ගිවිසුම් ප්‍රකාශයෙහි මෙම උපලේඛනයෙහි සඳහන් වන එම ගිවිසුමෙහි අදාළ වගන්තිවල නියමයන් බලාත්මක කිරීමට අවශ්‍යවන ප්‍රමාණයට. ඉහත කී පනතේ විධිවිධාන ලෝක සංරක්ෂණ සංගමය (ස්වභාව ධර්මය හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීමේ ජාත්‍යන්තර සංගමය) ට අදාළ විය යුතුයැයි මෙම නියමය මගින් ප්‍රකාශයට පත්කරමි.

මංගල සමරවීර පා.ම.,
විදේශ කටයුතු අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 30 වැනි දින,
කොළඹදී ය.

**උපලේඛනය**

**පාරිසරික සංරක්ෂණ ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ ලෝක සංරක්ෂණ සංගමය (ස්වභාව ධර්මය හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීමේ ජාත්‍යන්තර සංගමය) අතර ඇතිකර ගනු ලැබූ ගිවිසුම් ප්‍රකාශය**

7 එකඟවීම - පහත සඳහන් දේ ඇතුළුව, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහනේ ශ්‍රී ලංකා කාර්යාලයට පිරිනමා ඇති වරප්‍රසාද හා මුක්තිවලට වඩා අවාසිදායක නොවන සමහර වරප්‍රසාද හා මුක්ති ප්‍රදානය කිරීමට ද ශ්‍රී ලංකා ආණ්ඩුව එකඟ වේ.

(අ) මෙම ගිවිසුම් ප්‍රකාශයෙහි ඇමුණුමේ දැක්වෙන වරප්‍රසාද හා මුක්තීන් ලෝක සංරක්ෂණ සංගමය (ස්වභාව ධර්මය හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීමේ ජාත්‍යන්තර සංගමය) ට. එහි දේපළ, අරමුදල්, වත්කම් ආදියට ලබා දිය යුතු ය.

*වරප්‍රසාද හා මුක්තීන්*

*ලෝක සංරක්ෂණ සංගමයේ (ස්වභාව ධර්මය හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීමේ සංගමයේ) වරප්‍රසාද හා මුක්ති*

ලෝක සංරක්ෂණ සංගමය (ස්වභාව ධර්මය හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීමේ ජාත්‍යන්තර සංගමය) එහි දේපළ සහ වත්කම් කොතැනක පිහිටා තිබුණ ද කවුරුන් විසින් දරනු ලැබුව ද යම් විශේෂිත කරුණක දී එහි මුක්තිය ප්‍රකාශිත වශයෙන් අත්හැර ඇති ප්‍රමාණයට හැර, සියලුම නෛතික ක්‍රියාවලීන්ගෙන් මුක්තිය ලැබිය යුතු ය. කෙසේ වෙතත් කිසිම මුක්ති අත්හැරීමක් ඇස්කිසි කිරීමක් දක්වා යම් ප්‍රමාණයකට ව්‍යාප්ත කිරීමක් ලෙස අදහස් නොකෙරේ.

ලෝක සංරක්ෂණ සංගමයේ (ස්වභාව ධර්මය හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීමේ ජාත්‍යන්තර සංගමයේ) කාර්යාලය අලංඝනීය විය යුතු ය.

ලෝක සංරක්ෂණ සංගමයේ (ස්වභාව ධර්මය හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීමේ ජාත්‍යන්තර සංගමයේ) දේපළ සහ වත්කම් කොතැනක පිහිටා තිබුණ ද,කවුරුන් විසින් දරමින් සිටිය ද, සෝදිසි කිරීමෙන්, අත්පත් කරගැනීමෙන්, රජසතු කිරීමෙන්, අපසර්ජනයෙන් සහ විධායක, පරිපාලනමය,අධිකරණ හෝ ව්‍යවස්ථාදායක වූ හෝ වෙනත් ආකාරයේ අතුරුබාධනයන්ගෙන් මුක්ත විය යුතු ය.

කොතැනක තිබුණ ද ලෝක සංරක්ෂණ සංගමයේ (ස්වභාව ධර්මය හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීමේ ජාත්‍යන්තර සංගමයේ) පැරණි ලේඛනාගාරය ද පොදුවේ එයට අයත් හෝ ඒ මගින් දරා සිටින සියලුම ලේඛන අලංඝනීය විය යුතු ය. යම් ආකාරයේ මූල්‍ය පාලනයන්,විධිමත් කිරීම් හෝ විලම්බිත කාලයන් මගින් සීමා කිරීමකින් තොරව -

(අ) ලෝක සංරක්ෂණ සංගමය (ස්වභාව ධර්මය හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීමේ ජාත්‍යන්තර සංගමය) විසින් අරමුදල් හෝ ඕනෑම වර්ගයක මුදල් දරා සිටීම සහ ඕනෑම මුදලකින් ගිණුම් පවත්වාගෙනයාම කළ හැකිය.

(ආ) ලෝක සංරක්ෂණ සංගමයේ (ස්වභාව ධර්මය හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීමේ ජාත්‍යන්තර සංගමයේ) අරමුදල් හෝ මුදල් ශ්‍රී ලංකාවෙන් පිටත යම් වෙනත් රටකට මාරු කිරීමට සහ ප්‍රතිලෝම වශයෙන් එසේ කිරීමට සහ එමගින් දරනු ලබන යම් මුදලක් වෙනත් යම් මුදලකට හැරවීමට එයට නිදහස තිබිය යුතුය. එසේකුදු වුවත්. ශ්‍රී ලංකාවේ දී අත්පත් කරගනු ලැබූ අරමුදල් හෝ මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින් වූ අරමුදල් හෝ මුදල් මාරුකිරීමේ දී හා හැරවීමේ දී ,නීතියෙන් නියම කර ඇති යම් සීමාකිරීම්වලට යටත් විය හැකිය.

ලෝක සංරක්ෂණ සංගමයේ (ස්වභාව ධර්මය හා ස්වභාවික සම්පත් සංරක්ෂණය කිරීමේ ජාත්‍යන්තර සංගමය) එහි වත්කම්, ආදායම් සහ අනෙකුත් දේපළ -

(අ) සියලු ඍජු අයබදු වලින් නිදහස් විය යුතුය. කෙසේ වෙතත්.පොදු උපයෝගිතා සේවාවන් සඳහා අයකරනු ලබන වරිපනම් හා අයබදු වලින් නිදහස් කරන ලෙස ලෝක සංරක්ෂණ සංගමය (ස්වභාව ධර්මය හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීමේ ජාත්‍යන්තර සංගමය ) විසින් ඉල්ලා සිටින බවක් එයින් අදහස් නොකෙරේ.

(ආ) ලෝක සංරක්ෂණ සංගමය (ස්වභාව ධර්මය හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීමේ ජාත්‍යන්තර සංගමය) විසින් එහි නිල කාර්යයන් සඳහා ආනයනය හෝ අපනයනය කරනු ලබන භාණ්ඩ වෙනුවෙන් තීරු බදු හා බදු අයකිරීමෙන් නිදහස් කළ යුතුය. කෙසේ වෙතත්. එවැනි නිදහස් කිරීම් යටතේ ආනයනය කරනු ලැබූ භාණ්ඩ ප්‍රතිඅපනයන කළ යුතු අතර, ශ්‍රී ලංකා ආණ්ඩුවේ පූර්ව අවසරයක් නොමැතිව ශ්‍රී ලංකාව තුළ විකිණීම නොකළ යුතු බව අදහස් කෙරේ. ශ්‍රී ලංකාව තුළ විකුණනු ලැබුවේ නම් එවැනි භාණ්ඩ සාමාන්‍ය තීරු ගාස්තු හා බදුවලට යටත් වන්නේ ය.

(ඇ) එහි ප්‍රධාන ආනයනයන් හා අපනයනයන් තීරුබදු හා බදු වලින් ද තහනම් කිරීම් හා සීමා කිරීම් වලින් ද නිදහස් විය යුතුය.

ප්‍රමුඛත්වය පිළිබඳ කරුණු , තැපැල,කේබල් පණිවුඩ, විදුලි පණිවුඩ,ගුවන් විදුලි පණිවුඩ, විදුලි ඡායාරූප, දුරකථන හා අනෙකුත් පණිවුඩ හුවමාරුවල දී සහ පුවත්පත්, ගුවන්විදුලිය හා රූපවාහිනිය මගින් තොරතුරු ලබාදීම සඳහා ප්‍රචාරක ගාස්තු වෙනුවෙන් ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් එක්සත් ජාතීන්ට ප්‍රදානය කර ඇති ප්‍රමාණයට වඩා අවාසිදායක නොවන සැළකිල්ලක් ලෝක සංරක්ෂණ සංගමය (ස්වභාව ධර්මය හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීමේ ජාත්‍යන්තර සංගමය) ට හා එහි නිල සංදේශගත කටයුතුවල දී භුක්ති විඳීමට ඉඩදිය යුතුය.ලෝක සංරක්ෂණ සංගමයේ (ස්වභාව ධර්මය සහ ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීමේ ජාත්‍යන්තර සංගමයේ) නිල ලිපි හුවමාරු හා අනෙකුත් නිල සන්දේශගත කටයුතු වෙනුවෙන් ප්‍රවෘත්ති පාලනයක් නොකළයුතුය.

ලෝක සංරක්ෂණ සංගමය (ස්වභාව ධර්මය සහ ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීමේ ජාත්‍යන්තර සංගමය) ට සංකේත භාවිතයටත් පණිවුඩකරුවන් හෝ මලු මගින් එහි ලිපි හුවමාරු කිරීමටත් අයිතිය තිබිය යුතු අතර, ඒ සඳහා ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන් කාර්යාලය සඳහා ලබා දී ඇති සමාන මුක්ති වරප්‍රසාදයන් තිබිය යුතුය.

ශ්‍රී ලංකා එක්සත් ජාතීන් ගේ සංවර්ධන වැඩසටහන් කාර්යාලයට සහ එහි දේපළ, අරමුදල් හා වත්කම් සඳහා ලබා දි ඇති වෙනත් එවැනි වරප්‍රසාද හා මුක්තීන් ද තිබිය යුතුය.

10-712/7

---

**1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනත**

4 වැනි වගන්තිය යටතේ නියමය

1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර විදේශ අමාත්‍ය මංගල සමරවීර වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සමග 1995 සැප්තැම්බර් මස 15 වැනි දින ඇති කර ගන්නා ලද ගිවිසුමෙහි, මෙහි උපලේඛනයෙහි සඳහන් වන එම ගිවිසුමෙහි අදාළ වගන්තිවල නියමයන් බලාත්මක කිරීමට අවශ්‍ය වන ප්‍රමාණයට, ඉහත කී පනතේ විධිවිධානයන් යුරෝපීය ප්‍රජාවන්ගේ කොමිසමට අදාළ විය යුතු හැයි මෙම නියමය මගින් ප්‍රකාශයට පත් කරමි.

මංගල සමරවීර පා.ම.
විදේශ කටයුතු අමාත්‍ය

2016 සැප්තැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

ශ්‍රී ලංකාවේ සිටින යුරෝපීය ප්‍රජාවන් ගේ කොමිසමේ නියෝජනයක් ඇති කිරීම හා එහි වරප්‍රසාද හා මුක්තීන් පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ යුරෝපීය ප්‍රජාවන්ගේ කොමිසම අතර ඇති කර ගනු ලැබූ ගිවිසුම.

### *3 වැනි වගන්තිය*

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දේශය තුළ කොමිසමේ නියෝජනය, එහි ප්‍රධානය හා සාමාජිකයන් මෙන්ම ඔවුනොවුන්ගේ එක් එක් ගෘහස්ථයේ කොටසක් වන ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් ද තානාපති සම්බන්ධතා පිළිබඳ 1961 අප්‍රේල් මස 18 වන දිනැති වියානා සම්මුතියෙහි දක්වා ඇති සහ පිළිවෙලින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් පිළිගෙන ඇති දූත මණ්ඩලවල ප්‍රධානයන් සාමාජිකයන් මෙන්ම ඔවුනොවුන්ගේ එක් එක් ගෘහස්ථයේ කොටසක් වන ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් ට ලබා දී ඇති අයිතිවාසිකම්, වරප්‍රසාද හා මුක්තීන් සහ වගකීම්වලට සමාන ලෙස භුක්ති විඳිය හැකිය.

2. 1961 අප්‍රේල් මස 18 වන දිනැති වියානා සම්මුතියෙහි අනෙකුත් විධිවිධාන අවශ්‍ය වෙනස්කිරීම් සහිතව අදාල විය යුතුය.

3. ජනරජයේ දූත මණ්ඩලයට එහි ප්‍රධානයාට හා එහි සාමාජිකයන්ට මෙන්ම ඔවුනොවුන්ගේ එක් එක් ගෘහස්ථයේ සාමාජිකයන්ට සමාන අයිතීන් ද වරප්‍රසාද හා මුක්තීන් ද ලබාදීමේ කොන්දේසියට යටත්ව ය.

10-712/8

---

### 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනත

4 වැනි වගන්තිය යටතේ නියමය

1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර විදේශ අමාත්‍ය මංගල සමරවීර වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සමග 2016 ජූලි මස 13 වන දින ඇති කර ගන්නා ලද මූලික ගිවිසුමෙහි, මෙහි උපලේඛනයෙහි සඳහන් වන එම මූලික ගිවිසුමෙහි අදාල වගන්තිවල නියමයන් බලාත්මක කිරීමට අවශ්‍ය වන ප්‍රමාණයට, ඉහත කී පනතේ විධිවිධානයන් කොරියානු රජය සම්බන්ධ ණය ලබා ගැනීමේ, ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදලේ නියෝජිතයන්, කාර්ය මණ්ඩලය, පවුල්වල සාමාජිකයන් සහ කාර්යාලයට අදාල විය යුතු යැයි මෙම නියමය මගින් ප්‍රකාශයට පත් කරමි.

මංගල සමරවීර පා.ම.,
විදේශ කටයුතු අමාත්‍ය .

2016 සැප්තැම්බර් මස 30 වන දින,
කොළඹ දී ය.

### උපලේඛනය

**ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදලෙන් වර්ෂ 2016 - 2018 ණය ලබාගැනීම සම්බන්ධව කොරියානු ජනරජය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර මූලික ගිවිසුම**

ශ්‍රී ලංකා රජය විසින්, නියෝජිතයන්ට, කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට මෙන්ම කාර්යාලයට පහත සඳහන් වරප්‍රසාද, මුක්තීන් හා ප්‍රතිලාභ

(අ) නියෝජිතයින්, කාර්යමණ්ඩලය සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සඳහා;

(1) විදේශවල සිට ඔවුන් වෙත ප්‍රේෂණය කරන ලද පඩිනඩි හෝ දීමනා සම්බන්ධයෙන් ආදායම් බදු සහ වෙනත් පිස්කල් ගාස්තුවලින් නිදහස් කිරීම ;

(11) එක් එක් නියෝජිතවරයා හා කාර්ය මණ්ඩල සාමාජිකයා සඳහා මෝටර් රථයක් ඇතුළුව පෞද්ගලික හා ගේ දොර බඩු භාණ්ඩ ආනයනය කිරීමට සම්බන්ධ සේවාවන් පිළිබඳ ගාස්තු හැර සෙසු කොන්සියුලර් ගාස්තු රේගු ගාස්තු, තීරුබදු හා එම ස්වභාවයේ ගාස්තුවලින් නිදහස් කිරීම

එම අපනයනය කර කාර්ය මණ්ඩල සාමාජිකයා සහ කාර්ය මණ්ඩල සාමාජිකයා පැමිණි දින සිට මාස හයක් (මාස 06ක්) ඇතුළත ආනයන කර ඇත්නම් ඒවා පිළිබඳ විශේෂිත ආදායම් බලපත්‍ර ගාස්තුවලින් හා රියදුරු බලපත්‍ර ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ.

(111) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට කිසිදු වාහනයක් අපනයනය නොකරන නියෝජිත වරයෙකු හෝ කාර්ය මණ්ඩල සාමාජිකයෙකු දේශීය වශයෙන් මිළදී ගන්නා වාහනය සම්බන්ධයෙන් විශේෂ පරිභෝජන ගාස්තුවලින් හා අගය එකතු කළ බදුවලින් නිදහස් කරනු ලැබේ.

(IV) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දේශ සීමාවට ඇතුල් වීමට, ඉන් පිටවී යාමට හා පැවරුම් කාලය තුළ එම දේශ සීමාවෙහි රැඳී සිටීමට අවසර,විදේශිකයින් ලියාපදිංචි කිරීමේ කාර්ය පරිපාටිය කඩිනම් කිරීම හා පහසු කරවීම සහ කොන්සියුලර් ගාස්තු වලින් නිදහස් කිරීම

(V) සාමාජිකයින්,කාර්ය මණ්ඩලය හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දේශ භූමියට පැමිණීමේදී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බලධාරීන් විසින් ඔවුන් වෙත එක් මසක ප්‍රවේශ වීසා නිකුත් කිරීම, ඔවුන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දේශ භූමියට පැමිණීමේදී, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පවත්නා ආගමන හා විගමන නීති වලට අනුකූලව විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිර්දේශය මත, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව මඟින් බහුවිධ පිවිසුම් වාස වීසා නිකුත් කිරීම.

(VI) නියෝජිත පිරිස් හා කාර්ය මණ්ඩලය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දේශ භූමියට පැමිණීමෙන් පසුව,එම නියෝජිතයින්ට හා කාර්ය මණ්ඩලය වලට සිය කාර්ය කටයුතු ඉටු කිරීම සඳහා රජයේ සියලුම නියෝජිතායතන වලින් අවශ්‍ය සහාය සලසා ගැනීම සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම

(ආ) කාර්යාලය සඳහා

(1) ගබඩා කිරීමේ ගාස්තු, ගැල් කුලී සහ එම ස්වභාවයේ වෙනත් ගාස්තු හැර රේගු ගාස්තු,තීරු බදු,එම ස්වභාවයේ වෙනත් ගාස්තු වලින් නිදහස් කිරීම,එමෙන්ම, කාර්යාල උපකරණ ආනයනය කිරීම පිළිබඳ ආනයන බලපත්‍ර සහ විදේශ විනිමය සහතික ලබා ගැනීමෙන් නිදහස් කිරීම

(11) සපයා දිය යුතු මෝටර් රථවල සංඛ්‍යාව දෙරටෙහි ආණ්ඩුවල බලධාරීන් එකඟත්වයකට එළඹ ඇත්නම් කාර්යාලයට අවශ්‍ය මෝටර් රථ රේගු බදුවලින් නිදහසේම ආනයනය කිරීම හෝ විශේෂ පරිභෝජන බදුවලින් සහ අගය එකතු කළ බදුවලින් නිදහස්ව දේශීය වශයෙන් මිළදී ගැනීම

(111) කාර්යාලය වියදම් සඳහා විදේශවලින් ප්‍රේෂණය කරන ලද අරමුදල් මත හෝ ඒ සම්බන්ධයෙන් නියම කරන ලද ආදායම් බදුවලින් සහ අගය එකතු කළ බදුවලින් නිදහස් කිරීම

(1ඩ) කාර්යාල ගොඩනැගිලි බදු කුලී අගය එකතු කළ බදුවලින් නිදහස් කිරීම

(ඇ) නියෝජිතයන්ගේ, කාර්ය මණ්ඩලයේ හා කාර්යාලයේ කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය අනෙකුත් ක්‍රියාමාර්ග

3. ඉහත 2 වැනි ඡේදයේ සඳහන් මෝටර් වාහන පසුකාලීනව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ, තීරුබදු හෝ බදු නිදහස් කිරීම් හෝ වෙනත් ඒ හා සමාන වරප්‍රසාදයන්ට හිමිකම් නොකියන පුද්ගලයන්ට හෝ සමාගම්වළට විකුණන්නේ නම් එම වාහන රේගු බදු හා බදු ගෙවීම්වලට යටත් කළ යුතුය.

4. ඉහත 2 වැනි ඡේදයේ අ(11) සහ (ආ) (1) හා (11) උපඡේදයන්ට අනුකූලව රේගු බදු, බදු හා ඒ හා සමාන ස්වභාවයේ වෙනත් අය කිරීම්වලින් නිදහස් භාණ්ඩ ආනයනය කරන නියෝජිතයන්,කාර්ය මණ්ඩලය හා ඔවුන්ගෙන් පවුල් මෙන්ම කාර්යාලය ද, ආනයන හා ප්‍රති අපනයන උපචාරයන්ට සහාය වීම පිණිස, ශ්‍රී ලංකා රජයේ එකී කටයුතු සම්බන්ධයෙන් කටයුතු කරන අධිකාරියට එම භාණ්ඩ පිළිබඳ විස්තර ඉදිරිපත් කළ යුතුය.

5. නියෝජිතයන්,කාර්යාලය හා ඔවුන්ගේ පවුල් මෙන්ම කාර්යාලය ද මෙසේ රේගුබදු,බදු හා ඒ හා සමාන ස්වභාවයේ වෙනත් අයකිරීම් වලින් නිදහස්ව ආනයනය කරන ලද භාණ්ඩ ප්‍රතිඅපනයනය කිරීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ , විකිණීම හෝ ශ්‍රී ලංකා රජයේ අනුමැතිය මත ශ්‍රී ලංකා රජයට ලබා දීම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීති හා රෙගුලාසිවලට අනුකූලව සිදු කළ යුතුය.

6. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ සමාන මෙහෙයුමක නිරතව සිටින ඕනෑම තුන්වන රාජ්‍යයකට අයත් හෝ ඕනෑම ජාත්‍යන්තර සංවිධානයකට අයත් මෙහෙයුම් නියෝජිතායතනයක නියෝජිතයන්ට, කාර්ය මණ්ඩලයකට හෝ ඔවුන්ගේ පවුල්වලට හෝ කාර්යාලවලට ශ්‍රී ලංකා රජය විසින් ප්‍රදානය කරනු ලැබ ඇති වරප්‍රසාද,නිදහස් කිරීම් හා ප්‍රතිලාභ වලට වඩා අඩු නොවන ආකාරයට මෙම නියෝජිතයන්ට, කාර්ය මණ්ඩලයට හා ඔවුන්ගේ පවුල්වලට සහ කාර්යාලයට ද වරප්‍රසාද, නිදහස් කිරීම් හා ප්‍රතිලාභ ප්‍රදානය කිරීමට ශ්‍රී ලංකා රජය සැලකිලිමත් විය යුතුය.

10-712/9

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.